පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය -79

ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-ගාල්ල

පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் -79

நிறுவனத்தின் பெயர் : காலி மாவட்ட செயலகம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No -79

Name of the institution -District Secretariat Galle

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

<table>
<tr><td>2022 වර්ෂයේ මූල්‍ය හා කාර්ය සාධනය ඇගයීමේදි හඳුනාගත් අඩුපාඩු</td><td>එහිදි හඳුනාගත් දුර්වලතා හා එම දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ගනු ලබන උපක්‍රම හා යෝජනා</td></tr>
<tr><td>පළමු කොටස</td><td></td></tr>
<tr><td>හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.</td><td>හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර ඇත.</td></tr>
<tr><td>විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.</td><td>2022 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත විගණන විමසුම් 63ක් ලැබී තිබුණු අතර එයින් විගණන විමසුම් 08 ක් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දී නොතිබුණි.
ලැබෙන සියළුම විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.</td></tr>
<tr><td>අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.</td><td>දිස්ත්‍රික් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලදි ප්‍රාදේශීය ලේකම් සාකච්ජාවන්හිදි හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වලදි අභ්‍යන්තර විගණන වාර්තා සඳහා නියමිත කාලය තුල පිළිතුරු සැපයීම ප්‍රමුඛ කාර්යක් සේ සලකා කටයුතු කලයුතු බවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත, සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත හා සියළුම අංශ ප්‍රධානීන් වෙත දැනුවත් කිරීමට කටයුතු කර ඇත.තවද වර්තමානය වන විට අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් තුල පිළිතුරු ලබාදීමේ ප්‍රගතියක් ඇත.
<table>
<tr><th>වර්ෂය</th><th>ඉදිරිපත් කරන ලද විගණන වාර්තා ගණන</th><th>මසක් තුල පිළිතුරු ලබාදීමේ ප්‍රමාණය</th><th>ප්‍රතිශතය</th></tr>
<tr><td>2022</td><td>88</td><td>50</td><td>57 %</td></tr>
<tr><td>2023</td><td>109</td><td>69</td><td>63 %</td></tr>
</table></td></tr>
<tr><td>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටුව අවම ප්‍රමාණයෙන් හෝ රැස්ව නැත.</td><td>ප්‍රාදේශීය විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම 2022 වර්ෂයේ පහත පරිදි පවත්වා ඇති අතර,2023 වර්ෂයේ 100 % ප්‍රගතියක් අත්කරගෙන ඇත.
<table>
<tr><th>වර්ෂය</th><th>පැවැත්විය යුතු කමිටු ප්‍රමාණය</th><th>පවත්වා ඇති කමිටු ප්‍රමාණය</th><th>ප්‍රතිශතය</th></tr>
<tr><td>2022</td><td>88</td><td>86</td><td>98%</td></tr>
<tr><td>2023</td><td>88</td><td>88</td><td>100%</td></tr>
</table></td></tr>
<tr><td>වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.</td><td>මෙම වාහනය මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශ මත අලුත්වැඩියා කොට ධාවනය කිරීමට කටයුතු කර ඇත.</td></tr>
</table>

වර්ෂයකට වඩා වැඩි කලක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතිණ.

2022 වර්ෂයේ අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ පැවතීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග

අනු අංකය	ප්‍රා.ලේ කාර්යාලය	නම	තනතුර	අයකර ගැනීමට නොහැකි වූ හේතුව	හිඟ මුදල රු.	වර්තමාන ශේෂය රු.	ණය ශේෂ පැවතීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග (2024.06.30 දිනට)
1	කඩවත් සතර	කේ.ඒ.ඩී. වීරසිංහ මයා	ග්‍රාම නිලධාරී	වැඩ තහනම්	108,248.00	108,248.00	නීතිපති උපදෙස් ඉල්ලා ඇත.
2	නාගොඩ	ඩබ්.එච්.සි .වේවැල්වල මයා	සංවර්ධන නිලධාරී	සේවය හැර ගිය	66,354.85	54,976.81	මසකට රු.2500 බැගින් ණය කරුගේ බිරිඳ විසින් ගෙවනු ලබයි.

පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල 2022.12.31 දිනට වසර දෙකට වැඩි පොදු තැන්පත් ගිණුම්වල පවතින ශේෂ විස්තරයන්හි 2024.07.31 වන විට පවතින තත්ත්වය හා ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග පහත පරිදි වේ.

6000/0/0/13/0/62

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල

දිනය	මුදල	තැන්පතුව ලැබුනේ කාගෙන්ද යන්න	කාරණය	තැන්පතු නිදහස් නොකිරීමට හේතුව
2019.07.31	10,000,000.00	චමිලා සෝමරත්න පදනම	මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (දේශීය/විදේශීය ප්‍රධාන) විසින්2024.08.07 දිනැති ලිපියෙන් ලබාදෙන ලද උපදෙස් පරිදි නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුමට බැර කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.
	10,000,000.00			

6000/0/0/16/0/45

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල

දිනය	මුදල	තැන්පතුව ලැබුනේ කාගෙන්ද යන්න	කාරණය	තැන්පතු නිදහස් නොකිරීමට හේතුව
2015.12.31	167,993,279.99	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල මාර්ග කාපට් ව්‍යාපෘතිවල රැදවුම් මුදල්	2011-2014 වර්ෂවල ක්‍රියාත්මක වූ පළාත් මාර්ග කාපට් වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවල රැදවුම් මුදල් වේ. මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් වූ අතර, බිල්පත් විගණනය කිරීමට තාක්ෂණික කමිටුවක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින්, ස්ථාපිත කර එම කමිටුවේ නිරීක්ෂණ ලබාගෙන ඇත. එම කමිටුවේ නිරීක්ෂණය වී ඇත්තේ මෙම ව්‍යාපෘති සඳහා තාක්ෂණ අධීක්ෂණය ලබාදුන් ආයතනය මඟින්, අදාළ බිල්පත් පරීක්ෂා කර ලබාදිය යුතු බවයි. එම තීරණය අනුව, තාක්ෂණික අධීක්ෂණ ආයතනය වූ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අයත්, දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත අදාල බිල්පත් පරීක්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ නිරීක්ෂණ අනුව ඉදිරි කටයුතු සිදුවේ.
2017	5,692,512.82	මාර්ග සංවර්ධන අධිකාරිය	භං වතුරින් හානි වූ මාර්ග පුනරුත්ථාපනය	මේ සම්බන්ධව තාක්ෂණික උපදේශන ආයතනය වන මාර්ග සංවර්ධන. අධිකාරියේ නිර්දේශ ලද පසු නිදහස් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.
2015	1,854,649.41		වසර 5 ඉක්ම වූ වෙනත් තැන්පතු (මාර්ග ඉදිකිරීම් හා කාපට් කිරීම්)	විගණන විමසුම් පැවතීම, ඉතිරිවැඩ නිම කිරීමට ප්‍රතිපාදන නොමැති වීම ,කළ වැඩ ප්‍රමිතියෙන් තොර වීම , අදාල ආයතන වලින් නිර්දේශ නොලැබීම වැනි හේතු මත රඳවාගෙන ඇත.
2019-2020	16,071,990.99	සන්කෙන් කන්ස්ට්‍රක්ෂන්	ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරීම	උපදේශන ආයතන නිර්දේශ ලද පසු නිදහස් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.
	191,612,433.21			

හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 2022 වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂය යටතේ වෙන්වන ප්‍රතිපාදන මුදල් පදනම් කර ගත් 2022 සංවර්ධිත සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 22 න් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ ආයතන මණින්, දත්ත හා තොරතුරු ලබා ගන්නා ලදි. මෙහිදී දිස්ත්‍රික්කයට අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාල 22 ට අදාලව සංවර්ධිත ව්‍යාපෘතිවල තිරසර සංවර්ධන ඉලක්ක සඳහන් කර ඇති අතර, පැවති කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟම රාජ්‍ය නිලධාරින්ට අඛන්ඩව සේවයට වාර්තා කිරීමට බාධා පැමිණි අතර, එම අභියෝග මැද සියළුම රාජකාරි කටයුතු කිරීමට සිදුවිය.එසේම මෙම සැලැස්ම නියමිත කාලවකවානුව තුල සකස් කල යුතුව තිබුන නමුත්, සියළුම ආයතන සම්බන්ධීකරණය කිරීමේදී ඇති වූ ගැටළුකාරී තත්ත්වය මත ඇතැම් වාර්තාවල ඇතුලත් ව්‍යාපෘතිවල තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම අපහසු විය. 2023 වර්ෂයේදි මෙය නිවැරදි කිරිමට කටයුතු කර ඇත. .
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	දැනට යටත් මට්ටමේ විගණන මතයක් පවති. මෙම විගණන මතය සඳහා බලපා ඇති කල් ඉකුත්වූ පොදු තැන්පතු හා අනෙකුත් වැරදි නිවැරදි කර ගැනීම තුලින් හැකි ඉක්මනින් හොඳ මතයක් ලබා ගැනීමට කටයුතු කරමි.
හදුනාගත් සේවා ඉලක්ක සපුරා ගැනීම ගැනීම මැන බැලීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට හදුනාගත් සේවා ඉලක්ක සපුරා ගැනීම මැන බැලීම සඳහා මාසිකව ප්‍රගතිය සමාලෝචනය කිරිමට කටයුතු කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි.	2401 වැය විෂය යටතේ 2022 වර්ෂයේ ලද ප්‍රතිපාදන රු.6,500,000.00 කි.එම ප්‍රතිපාදන වලින් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/GN/130/18/2022 හා 2022.06.03 දිනැති ලිපිය අනුව අවුරා තබන ලද ප්‍රමාණය රු.4,400,000.00 වන අතර ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය රු.3,574.00 ක් වන අතර වියදම 2,096,426.00 කි. 2022 වර්ෂය තුල රට තුල උද්ගතව පැවති තත්ත්වය හේතුවෙන් ලිපිදුව්‍ය මිල ඉහළයාම සහ සංග්‍රහ කටයුතු වලට අදාල ආහාරපාන මිල ඉහළයාම,පවතින ඉන්ධන අර්බුධය සහ විදුලිය අත්හිටුවීම හේතුවෙන් ශාලා වෙන්කර ගත නොහැකිවීම යන හේතූන් මත වියදම් අඩුකිරිමට රජය ගෙන ඇති තීරණයද සැලකිල්ලට ගෙන පුහුණු වැඩසටහන් පෙර සැලසුම් කරතිබු පරිදි ක්‍රියාත්මක කිරිමට නොහැකිවු අතර 2022 වසරේ මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුව සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබු පුහුණු අවස්ථා ප්‍රමාණය 69 % ක ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇති බවත්, මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් රාජ්‍ය ආයතන ඇගයීම (2022 මුදල් වර්ෂය) පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමු වාර්තාවේ දෙවැනි කොටස අනුව සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබු පුහුණු අවස්ථා ප්‍රමාණය 50 % ට වඩා අඩු මට්ටමක නොපවතින බව දන්වමි.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අලි හානි හා වෙනත් වන සතුන්ගෙන් සිදුවන හානි පිළිබඳ වන්දි කමිටුව රැස්වී නොතිබුණි.	තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයෙන් වන අලි හානි වන්දි ගෙවීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.එම අනුමැතිය පරිදි වන අලි පහර දීමෙන් සිදුවන මරණ, ශාරීරික හානි, සහ දේපළ හානි වන්දි ගෙවීම වෙනුවෙන් අදාල සංශෝධනයන් සිදුකර ඇත. ඒ අනුව මෙම වන්දි කමිටුව ගාල්ල දිස්ත්‍රික්කයට අදාල නොවන බව දන්වමි.

.....

ඩබ්.ඒ.ධර්මසිරි,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

ඩබ්.ඒ.ධර්මසිරි
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය

.....

ඩී.එස්.රණසිංහ,
ප්‍රධාන ගණකාධිකාරි,

ඩී.එස්. රණසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගාල්ල.

[redacted]ගේ නිර්දේශය

[redacted] පෙනෙන් විසින් දැනි ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් [redacted] වාර්තාව පොදු පරීක්ෂණ වලින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

[redacted]
ලේකම්
පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු ආංශය)
"මිල මැදුර" ආලවිරිහල මාවත, කොළඹ 05.

[redacted] ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

[redacted]මාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

[redacted] නිලධාරී කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරවීන් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන් (පා.ම.)

ග්‍රාමීණ්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය